Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 11

ශ්‍රේණිය - 13

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 12.0 - සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
නිපුණතා මට්ටම 12.2 - කොටස් නිකුතුවේදී ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගන්නා විට එම ගනුදෙනු ගිණුම්ගත කරයි.

1.කොටසක ප්‍රතිෂ්ඨාව සම්බන්ධව පහත වගුව සම්පූර්ණ කරන්න.

| කොටසක ප්‍රතිෂ්ඨාව යන්න හැඳින්වීම | කොටසක් ප්‍රතිෂ්ඨාව තීරණය කිරීම සිදු කරන පාර්ශ්ව | කොටසක ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් ලබා ගන්නා දේවල් | කොටසක ප්‍රතිෂ්ඨාව ලබා ගන්නා ආකාරය |
|---|---|---|---|
| | | | |

2.) 2020/01/01 දින සීමිත අශෝක සමාගම රු.40 සාමාන්‍ය කොටස් 100,000ක් මහජනයා වෙත නිකුත් කළේය.අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දින 2020/01/31 වේ.2020/01/31 වන විට කොටස් 120,000කට මුදල් ලැබී තිබුණි.
සමාගම වැඩිපුර ලද මුදල් 2020/02/05 දින කොටස්හිමියන්ට ආපසු යැවීය.පසුව ඉතිරි මුදල් ප්‍රාග්ධනිත කරන ලදී.
ඉහත ගනුදෙනුවලින් පැන නගින තත්ත්වයන් ගිණුම්වල වාර්තා කරන්න.

3.)2020/01/01 දින සීමාසහිත අරුණලු සමාගම රු.50 සාමාන්‍ය කොටස් 100,000ක් අයදුම්පත්‍ර සමඟ මුළු මුදල් ලබා ගැනීම සඳහා මහජනයා වෙත නිකුත් කළේය.අයදුම්පත්‍ර භාර ගැනීම 2020/01/31 දින අවසන් විය.එදින වන විට කොටස් 250,000ක් සඳහා මුදල් ලැබී තිබිණි.

අවශ්‍ය වන්නේ,

ඉහත සිද්ධිය උපයෝගී කර ගෙන පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සපයන්න.

1.අයදුම්පත්‍ර සමඟ ලද මුළු මුදල කීයද?
2.ප්‍රතික්ෂේප කළ අයදුම් මුදල් කොපමණද?
3.ප්‍රාග්ධනිත කළ වටිනාකම කොපමණද?
4.මුදල් ගිණුමට සියලු අයදුම් මුදල් ලැබුණි නම් ගනුදෙනු කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්(මුදල් සමඟ) දක්වන්න.